**පුනාකරෙයි ප්‍රාදේශීය සභාව**
**කිලිනොච්චි දිස්ත්‍රික්කය**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 23 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 24 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පුනාකරෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳුනු ගිණුම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල හිඟ අදායම් රු. 5,723,939 ක් ලෙස දක්වා තිබුණද, අදාල හිඟ ආදායම් සම්බන්ධ සටහන්වල මුළු එකතුව රු. 4,971,034 ක් ලෙස පෙන්වා තිබීමෙන් රු. 752,905 ක විචලනයක් නිරීක්ෂණය විය.

#### 1.3.3 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| ---------------------------------------- | ------------ | ------------------ |
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) පරිච්ඡේදය III රීති 66 | 5,723,939 | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සභාවේ ලේකම් විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය V රීති 140 | 749,223 | ගෙවන ලද අත්තිකාරම් නිසි පරිදි අයකර ගැනීම සඳහා පසුගිය මාස 01 සිට වර්ෂ 04 දක්වා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (iii) රීති 178(3) | | කොන්ත්‍රාත් වැඩ සාර්ථකව ඉටුකරන ප්‍රජා සංවිධාන, ප්‍රජා මධ්‍යස්ථානවල නම් ඇතුලත් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (iv) රීති 178(5) | | ටෙන්ඩර්පත්‍ර ලබාදීමේදී ලියාපදිංචි තැපැල් මගින් හෝ සභාපති විසින් බලය පවරන ලද නිලධාරියෙකු මගින් හෝ සිදුවී නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| -------------------------------- | | |
| මුදල් රෙගුලාසි 571 | 3,716,771 | කල් ඉකුත්වූ තැන්පත් 112 ක් සම්බන්ධයෙන් පසුගිය වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක සිට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| ----------------------------- | | |
| (i) 2008 දෙසැම්බර් 30 දිනැති අංකය 30/2008 | 51,880 | අනුමතකර තිබූ ආපදා ණය සීමාව වන රු. 250,000 ක් ඉක්මවා නිලධාරියෙකුට ආපදා ණය ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. |
| (ii) 2017 අප්‍රේල් 19 දිනැති අංකය 03/2017 | | රාජ්‍ය නිලධාරින් පැමිණීමට හා පිටත්වීමට සනාථ කිරීම සඳහා ඇඟිලිසැලකුන කිරීමේ යන්ත්‍ර සටහන් පවත්වා නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 4,809,086 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 5,012,326 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | --------- | ------------ | -------------- | ------------ | ------------ | ------------ | ------------ | ------------ | ------------ |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 27,000 | - | 38,000 | - | - | - | 33,675 | - |
| (ii) | කුලී | 3,915,045 | - | 2,530,644 | 723,580 | 3,450,030 | - | 1,373,999 | 601,357 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 690,450 | - | 800,952 | - | 562,600 | - | 665,935 | - |
| (iv) | වෙනත් ආදායම් | 4,680,680 | - | 4,118,198 | 562,481 | 5,189,700 | - | 4,054,656 | 1,135,044 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ උසාවි දඩ රු. 2,727,333 ක හා මුද්දර ගාස්තු රු. 1,520,121 ක් විය.

## 3 මෙහෙයුම් සමාලෝචිතය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතාවය

සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂවල ක්‍රියාත්මක කිරීමට සැලැසුම්කර මූලා‍ ප්‍රකාශනවල ප්‍රතිපාදන වෙන්කර කර තිබූ මුළු එකතුව රු. 520,783 ක් වටිනා ප්‍රාග්ධන වැඩ ක්‍රියාත්මක කිරීමට වසර 01 සිට 03 දක්වා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය

**නිෂ්කාර්ය වත්කම්**

මුළු එකතුව රු. 205,000 ක් වටිනා මහජන පොළවල් පහක් සහ කරවල කඩ 05 ක් බදු දීමට ටෙන්ඩර් කැඳවා තිබුණද, බදුකරුවන් කිසිවෙක් ඉදිරිපත් නොවීමෙන් වර්ෂ 02 ක කාලයක් නිෂකාර්යව තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**සේවක මණ්ඩල පුරප්පාඩු සහ අතිරික්ත**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩල 65 ක් වුවද, 37 ක් පමණක් සේවය කරන බැවින් පුරප්පාඩු 28 ක් තිබුණි. මෙම පිරවීමට කටයුතු නොකිරීමෙන් එම අයගෙන් කරගතයුතු වැඩවල බාධා සිදුවී ඇත.

**3.4 ප්‍රමාදවූ ව්‍යාපෘති**

සමාලෝචිත වර්ෂයේදී මුළු එකතුව රු. 8,062,018 ක් වටිනාකමට ඇස්තමේන්තු කර තිබූ ප්‍රාග්ධන වැඩ 08 ක්‍රියාත්මක කිරීමේදී මාස 8 ක ප්‍රමාදයක් දක්නට ලැබුණි.

**3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභා බල ප්‍රදේශයෙන් ඉවත් කරන කැලිකසල පිළිස්සීම සහ පස්වලින් යටකිරීම යන ක්‍රියාමාර්ග පමණක් සභාව විසින් අනුගමනය කර තිබුණු අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණය වැනි වැඩ සටහන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම්, තත්‍ය වියදම් අතර රු. 5,846 සිට 2,610,732 දක්වා නොහොත් සියට 12.5 සිට සියයට 29 දක්වා විචලනයක්ද ඇස්තමේන්තු ගත ආදායම් සහ තත්‍ය ආදායම් අතර රු. 723,580 සිට රු.562,481 ක් දක්වා නොහොත් සියයට 18 සිට සියයට 12 දක්වා විචලනයන්ද නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා සමාලෝචිත වර්ෂයට අදාල අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5 පද්ධති හා පාලන**

විගණනයේ නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩු |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) මුදල් ප්‍රවාහන ප්‍රකාශ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර නොතිබුණි. |
| | (ii) උසාවි දඩ සහ මුද්දර ගාස්තු නිසි පරිදි ආදායම් ලෙඛනයට ඇතුලත් කර නොතිබුණි. |
| (ආ) වත්කම් / දේපල | සභාව වෙත පවරා නොගත් වාහන 32 ක් පසුගිය වර්ෂ 01 සිට 07 දක්වා සභාව විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණි. |
| (ඇ) ආදායම් ණය ගැතියෝ | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂන පිළියෙළ කර නොතිබීම. |
| (ඈ) මානව සම්පත් කළමනාකරණය | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඉ) ව්‍යපෘති / කොන්ත්‍රාත් | ඉකුත් වර්ෂයට පෙර වර්ෂවල සිට ආරම්භ කළ ප්‍රාග්ධන වැඩ නිසි කාලයේදී නිමකර නොතිබුණි. |